වාර්ෂික වාර්තාව - 2018

ජාතික පර්යේෂණ සභාව

ජාතික පර්යේෂණ සභාව
120/7, විද්‍යා මාවත, කොළඹ 07
දුරකථන අංකය: 011-2675176 ෆැක්ස්: 011-2675136
ඊ-මේල්: admin@nrc.gov.lk වෙබ්: www.nrc.gov.lk

පටුන

පටුන 1

දැක්ම සහ මෙහෙවර 2

අරමුණු 3

කාර්යයන් 4

කවුන්සිලය 5

කාර්ය මණ්ඩලය 7

සභාපතිතුමාගේ පණිවුඩය 8

ප්‍රධාන විධායක ලේකම් වාර්තාව 10

පසුගිය වර්ෂ තුනට අදාළ මූල්‍ය සුවිශේෂීතාවයන් 12

ජාතික පර්යේෂණ සභාවේ වැඩසටහන් 13

ඉලක්ක මත පදනම් වූ බහුවිෂයානුබද්ධ පර්යේෂණ ප්‍රදාන 13

අන්වේෂක මත පදනම් වූ පර්යේෂණ ප්‍රදාන 14

විද්‍යාත්මක ප්‍රකාශන සඳහා ජනාධිපති සම්මාන ප්‍රදානය 15

රාජ්‍ය-පෞද්ගලික සහයෝගීතා වැඩසටහන 15

වෙනත් වැඩසටහන් 16

2018 විශේෂ අවස්ථා 17

වාර්ෂික ගිණුම් - 2018 35

විගණකාධිපතිගේ වාර්තාව 36

සම්බන්ධවිය හැකි අයුරු පිළිබඳ තොරතුරු 37

දැක්ම

“දැනුම හා විද්‍යාව පදනම් කරගත්
සංවර්ධිත රටක තත්ත්වයට
ශ්‍රී ලංකාව පත් කිරීම”

මෙහෙවර

“මූලික හා ප්‍රායෝගික පර්යේෂණ ප්‍රවර්ධනය,
මූල්‍යනය හා පහසුකම් සැපයීම සහ අධීක්ෂණය සහ
ශ්‍රී ලංකාවේ මානව සම්පත් වර්ධනය තුළින්
දැනුම හා විද්‍යාව පදනම් කරගත්
සංවර්ධිත රටක තත්ත්වයට ශ්‍රී ලංකාව පත්කිරීම”

අරමුණු

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ 2016 අංක 11 දරණ පනත හා අනුකූලව, ජාතික පර්යේෂණ සභාවේ අරමුණු වන්නේ;

- රට තුළ ක්‍රියාකාරී විද්‍යාත්මක සහ තාක්ෂණික ප්‍රජාවක් ගොඩනැංවීම අරමුණු කරගනිමින් විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රයේ පර්යේෂණ සිදුකිරීම පිණිස පහසුකම් සපයාදීම සඳහා රජයට සහාය ලබාදීම;

- ජාතික අවශ්‍යතාවන් සඳහා දායකත්වය සපයන පර්යේෂණ පදනමක් සංවර්ධනය කිරීම පිණිස උසස් අධ්‍යාපන ආයතනයන්හී, රාජ්‍ය අංශයේ පර්යේෂණ හා සංවර්ධන ආයතනයන්හී සහ වෙනත් රාජ්‍ය ආයතනයන්හී විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රය හා අදාළව සිදුකෙරෙන පර්යේෂණ ප්‍රවර්ධනය සහ ඒ සඳහා පහසුකම් සැලසීම;

- විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රය හා අදාළ පර්යේෂණ වැඩිදියුණු කිරීම සඳහා පෞද්ගලික අංශයේ සහයෝගීතාවය අපේක්ෂා කිරීම;

කාර්යයන්

- සභාවේ අරමුණු ළඟා කරගනු වස් විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රය හා අදාළ පර්යේෂණයන් සිදුකිරීම සඳහා ප්‍රතිපාදන සලසාදීම;
- පර්යේෂණ සඳහා රජය විසින් සිදුකරනු ලබන ආයෝජනයන් ඵලදායී ලෙස භාවිතා කිරීම සහතික කරනු පිණිස, උසස් අධ්‍යාපන ආයතන, රාජ්‍ය අංශයේ පර්යේෂණ ආයතන සහ වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබාදී ඇති ප්‍රතිපාදන හා සම්බන්ධ විද්‍යා හා තාක්ෂණික පර්යේෂණ සඳහා පහසුකම් සැලසීම, සම්බන්ධීකරණය, අධීක්ෂණය හා සුපරීක්ෂණය සිදුකිරීම;
- සභාවෙහි කාර්යයන් කාර්යක්ෂමව පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය පිරියත, යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ ආනයනය කිරීම සහ පිළිගත් දේශීය හෝ විදේශීය ප්‍රභවයන් වෙතින් උපකරණ, අරමුදල් සහ අනෙකුත් සහායයන් ලබාගැනීම;
- විද්‍යාව හා තාක්ෂණය සහ අදාළ විෂයයන් පිළිබඳව සිදුකෙරෙන පර්යේෂණයන්හී වාර්තා, වාර සඟරා සහ පත්‍රිකා ඒකරාශී කිරීම, මුද්‍රණය සහ ප්‍රකාශයට පත්කිරීම;
- දේශීය හෝ විදේශීය විද්‍යා හා තාක්ෂණ ආයතනයන්හී සිදුකෙරෙන විද්‍යාත්මක අධ්‍යයනයන් හෝ විද්‍යාත්මක කාර්යයන් සඳහා ශිෂ්‍යත්ව සහ අධිශිෂ්‍යත්ව පිරිනැමීම;
- විද්‍යාව හා තාක්ෂණය සහ අදාළව සිදුකෙරෙන පර්යේෂණ හා නවෝත්පාදන පිළිගැනීමට ලක්කිරීමේ සහ ඒවාට සම්මාන ප්‍රදානය කිරීමේ ජාතික වැඩපිළිවෙලක් වැඩිදියුණුකිරීම; සහ
- විද්‍යාව හා තාක්ෂණය සහ අදාළ විෂයයන් ආශ්‍රිතව සිදුකෙරෙන පර්යේෂණ පිළිබඳ දේශන, සම්මන්ත්‍රණ සහ වැඩමුළු පැවැත්වීම.

කවුන්සිලය (2016-08-30 සිට 2018-05-18දක්වා)

සභාපති

1. මහාචාර්ය හිතනාදුර ජනක ද සිල්වා

අනෙකුත් සාමාජිකයින්

2. මහාචාර්ය උපාලි අමරසිංහ
3. මහාචාර්ය වීරතුංග ආරච්චිගේ ජනේන්ද්‍ර මාතලී ද කොස්තා
4. මහාචාර්ය විරංජිත් ප්‍රියාන් සොලමන් ඩයස්
5. මහාචාර්ය ලක්ෂමන් දිසානායක
6. මහාචාර්ය වේරංජ කරුණාරත්න
7. මහාචාර්ය කාමිනී නිර්මලා මෙන්ඩිස්
8. ඉංජිනේරු මොක්සෙවි ප්‍රේලිස්
9. ආචාර්ය ගල්බඩ ආරච්චිගේ සිරිමල් ප්‍රේමකුමාර
10. මහාචාර්ය අරුණි තිලකරත්න

විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයේ නියෝජිත

11. හිමාලි අතාවුදගේ මිය

භාණ්ඩාගාර නියෝජිත

12. ඊ.ඒ. රත්නසීල මයා

කවුන්සිලය (2018-07-06 සිට 2018-12-31දක්වා)

සභාපති

1. මහාචාර්ය හිතනාදුර ජනක ද සිල්වා

අනෙකුත් සාමාජිකයින්

2. මහාචාර්ය උපාලි අමරසිංහ
3. මහාචාර්ය වීරතුංග ආරච්චිගේ ජනේන්ද්‍ර මාතලී ද කොස්තා
4. මහාචාර්ය විරංජිත් ප්‍රියාන් සොලමන් ඩයස්
5. මහාචාර්ය ලක්ෂමන් දිසානායක
6. මහාචාර්ය වේරංජ කරුණාරත්න
7. මහාචාර්ය කාමිනී නිර්මලා මෙන්ඩිස්
8. ඉංජිනේරු මොක්සෙවි ප්‍රේලිස්
9. ආචාර්ය ඇෂ්ලි ඩි වොස්
10. මහාචාර්ය අරුණි තිලකරත්න

විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයේ නියෝජිත

11. හිමාලි අතාවුදගේ මිය

භාණ්ඩාගාර නියෝජිත

12. ඊ.ඒ. රත්නසිල මයා

කාර්ය මණ්ඩලය

ප්‍රධාන විධායක නිලධාරී:	එම්.සී. රාජපක්ෂ
සහකාර අධ්‍යක්ෂ (විද්‍යාත්මක කටයුතු):	පී. කේ. ඒ. එස්. ආර්. නෝනිස්
සහකාර අධ්‍යක්ෂ (පරිපාලන හා මූල්‍ය):	ආර්. කේ. එස්. දිසානායක
විද්‍යාත්මක නිලධාරී:	එන්.කේ. දිසානායක
විද්‍යාත්මක නිලධාරී:	ඩබ්.කේ.එන්. හංසනා
විද්‍යාත්මක නිලධාරී:	එස්.එස්. කටුගම්පල
පරිපාලන නිලධාරී:	ඒ. කේ. ඩි. එම්. පෙරේරා
ගිණුම් නිලධාරී:	ඒ. ඊ. කේ. දයාරත්න
ප්‍රසම්පාදන නිලධාරී:	ඩබ්. ඩී. ටී. ඩි. වික්‍රම
කළමනාකරණ සහකාර:	එස්. එච්. එස්. ප්‍රියංකර
කළමනාකරණ සහකාර:	එම්. ඩී. ටී. මධුෂානි
කළමනාකරණ සහකාර:	එම්. එස්. සෙව්වන්දි
කළමනාකරණ සහකාර:	එම්. ඒ. එල්. කේ. පොර්රා
කළමනාකරණ සහකාර:	කේ. ඒ. ඩී. එම්. කරුණාසිංහ
කළමනාකරණ සහකාර:	එන්. ඊ. අත්තනායක
රියදුරු:	කේ. කේ. ටී. සඳරුවන්

2018.12.31 දිනට

සභාපතිතුමාගේ පණිවුඩය

ජාතික පර්යේෂණ සභාවේ 2017 වර්ෂය සඳහා වන වාර්ෂික වාර්තාව, පාර්ලිමේන්තුවේ සභාගත කිරීම සඳහා ඉදිරිපත් කරනුයේ ඉමහත් සතුටිනි. ජාතික පර්යේෂණ සභාවේ ප්‍රධාන කාර්යභාරය වනුයේ පර්යේෂණ සඳහා අරමුදල් ලබාදීම හා ජාතික වශයෙන් පිළිගත් වැඩපිළිවෙලක් වැඩිදියුණු කිරීම හා ශ්‍රී ලංකීය විද්‍යාඥයින්ගේ සාර්ථක පර්යේෂණ හා නවෝත්පාදන සඳහා සම්මාන පිරිනැමීමයි.

2016 වසරේදී, පාර්ලිමේන්තු පනතක් මඟින් ව්‍යවස්ථාපිත ආයතනයක් ලෙස ස්ථාපනය කරනු ලැබූ ජාතික පර්යේෂණ සභාව සඳහා දැනට එහි සේවයේ නියුතු කාර්ය මණ්ඩලය ස්ථීර කාර්ය මණ්ඩලයට අන්තර්ග්‍රහණය කිරීම 2018 වනවිට නිමකර ඇත.

විද්‍යාත්මක ප්‍රකාශන සඳහා ජනාධිපති සම්මාන උළෙල මෙම වසරේ නොවැම්බර් මසදී පවත්වන ලදී. අතිගරු ජනාධිපතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්වුණු මෙම සම්මාන ප්‍රදානෝත්සවයේදී 2016 වසරේදී පළකරනු ලැබූ විද්‍යාත්මක ප්‍රකාශනයන් වෙනුවෙන් විද්‍යාඥයින් 338 දෙනෙකුට සම්මාන පිරිනමන ලද අතර තවත් විද්‍යාඥයින් 328 දෙනෙකු සඳහා ජාතික පර්යේෂණ සභාවේ කුසලතා සම්මාන ප්‍රදානය කෙරිණි.

ගරු විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමන්ට, රාජ්‍ය අමාත්‍යතුමන්ට සහ අමාත්‍යාංශ ලේකම්තුමාට, ඔවුන් විසින් නිබඳව ලබාදුන් සහාය සහ දිරිගැන්වීම වෙනුවෙන් ජාතික පර්යේෂණ සභාවේ ස්තූතිය පිරිනැමීමට කැමැත්තෙමි.

විද්‍යාජ්‍යෝති මහාචාර්ය එච්. ජනක ද සිල්වා
සභාපති

ප්‍රධාන විධායක නිලධාරි වාර්තාව

ජාතික පර්යේෂණ සභාවේ 2018 වසර සඳහා වන වාර්ෂික වාර්තාවට පණිවුඩයක් ලබාදීමේ මෙම අවස්ථාව මාගේ ඉමහත් ප්‍රීතියට හේතු වන අතර මේ තුළින් මෙම වසර තුළ ජාතික පර්යේෂණ සභාවේ ක්‍රියාකාරකම් පිළිබඳ දැක්මක් ඔබ වෙත ලැබේ යැයි අපේක්ෂා කරමි. වසර තුළ සිදුකරනු ලැබූ කාර්යයන් පිළිබඳ වාර්තා කිරීමේදී මෙන්ම ඒ පිළිබඳ වාර්තාවක් සැපයීමේදී වාර්ෂික වාර්තා සඳහා වැදගත් ස්ථානයක් හිමිවේ.

2016 අංක 11 දරණ පනත හා අනුකූලව ජාතික පර්යේෂණ සභාවේ ප්‍රධාන අරමුණු වනුයේ, රට තුළ ක්‍රියාකාරී විද්‍යාත්මක සහ තාක්ෂණික ප්‍රජාවක් ගොඩනැංවීම අරමුණු කර ගනිමින් විද්‍යා තාක්ෂණ ක්ෂේත්‍රයේ පර්යේෂණ සිදුකිරීම පිණිස පහසුකම් සපයාදීම සඳහා රජයට සහාය ලබාදීම, ජාතික අවශ්‍යතාවන් සඳහා දායකත්වය සපයන පර්යේෂණ පදනමක් සංවර්ධනය කිරීම පිණිස උසස් අධ්‍යාපන ආයතනයන්හී, රාජ්‍ය අංශයේ පර්යේෂණ ආයතනයන්හී සහ වෙනත් රාජ්‍ය ආයතනයන්හී විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රය හා අදාළව සිදුකෙරෙන පර්යේෂණ ප්‍රවර්ධනය, ඒ සඳහා පහසුකම් සැලසීම සහ විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රය හා අදාළ පර්යේෂණයන් වැඩිදියුණු කිරීම සඳහා පෞද්ගලික අංශයේ සහයෝගිතාවය අපේක්ෂා කිරීමයි.

ජාතික පර්යේෂණ සභාවේ ප්‍රධාන කාර්යභාරය වනුයේ, විද්‍යාත්මක පර්යේෂණ සහ සංවර්ධන (R&D) ආයතනයන් සහ උසස් අධ්‍යාපන ආයතනයන්හී පර්යේෂකයින්හට පර්යේෂණ සිදුකිරීම සඳහා ප්‍රදානයන් පිරිනැමීමත්, විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රය හා සම්බන්ධිත පර්යේෂණ හා නවෝත්පාදනයන් පිළිගැනීමට ලක්කිරීම සහ සම්මාන ප්‍රදානය කිරීම සඳහා ජාතික ක්‍රමවේදයක් වැඩිදියුණු කිරීමවේ.

මෙම වැදගත් අභිමතාර්ථ කරා ලගාවීම සඳහා 2017 වර්ෂය තුළදී ජාතික පර්යේෂණ සභාව විසින් පහත වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබිණි; අන්වේෂක මත පදනම් වූ පර්යේෂණ ප්‍රදාන වැඩසටහන, රාජ්‍ය-පෞද්ගලික දෙඅංශයේ සහයෝගීතා වැඩසටහන, ඉලක්ක මත පදනම් වූ බහුවිෂයානුබද්ධ පර්යේෂණ ප්‍රදාන වැඩසටහන, විද්‍යාත්මක ප්‍රකාශන සඳහා ජනාධිපති සම්මාන, සමාජ සුභසාධන සහ මහජන දැනුවත් කිරීමේ වැඩසටහන.

1999 වර්ෂයේදී ආරම්භ කරනු ලැබූ අන්වේෂක මත පදනම් වූ පර්යේෂණ ප්‍රදාන වැඩසටහන යනු, අවම පරිපාලන පටිපාටීන් යටතේ පර්යේෂණ සිදුකිරීම සඳහා විද්‍යාඥයින් වෙත තරහකාරී පදනම මත පහසුකම් සපයාදෙනු ලබන ප්‍රතිපාදන යෝජනා ක්‍රමයකි. 2018 මූල්‍ය වර්ෂය තුළදී අයැදුම්පත් 109ක් ලද අතර පශ්චාත් උපාධි අධිශිෂ්‍යත්ව 22ක් ප්‍රදානය කරමින් ඉන් අයැදුම්පත් 24ක් සඳහා මූල්‍යාධාර ලබාදෙනු ලැබිණි. මෙම වර්ෂය තුළදී ප්‍රදානයන් 150කට අධික සංඛ්‍යාවක් ක්‍රියාත්මකව පැවතිණි. ප්‍රදානයන් 14ක් සම්බන්ධව අවසාන ඇගැයීම් ක්‍රියාවලිය සම්පූර්ණ කරනු ලැබ ඇති අතර SCIE ප්‍රකාශන 16ක් සහ පශ්චාත් උපාධි අපේක්ෂකයින් 09දෙනෙකු විසින් සිය උපාධීන් ලබාගැනීම (ආචාර්ය උපාධීන් 04ක් සහ දර්ශනපති උපාධි 05ක්) සහ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ 83කදී පර්යේෂණ සොයාගැනීම් බෙදාහැරීම යනාදිය මේ යටතේ ප්‍රතිඵල විණි.

2012 වර්ෂයේදී ආරම්භ කරනු ලැබූ රාජ්‍ය-පෞද්ගලික සහයෝගීතා වැඩසටහන (PPP) හරහා රජයේ පර්යේෂණ හා සංවර්ධන ආයතනයන්හී සහ විශ්වවිද්‍යාලයන්හී විද්‍යාඥයින් සහ පෞද්ගලික අංශය අතර සහයෝගීතාවයන් ඇතිකර ගැනීම සඳහා පහසුකම් සලසා දේ. මෙම ව්‍යාපෘතීන් මඟින්, පර්යේෂණයන් සිදුකළ යුතු පර්යේෂණ ක්ෂේත්‍රයන් සහ ඒවායේ වාණිජමය විභවතාවය පැහැදිළි ලෙස හඳුනාගනී. නව අභිමතයන් පළකිරීම් (EoIs) කැඳවනු ලැබූ අතර EoI 15ක් ලැබූ අතර ඒ සම්බන්ධයෙන් කටයුතු කරනු ලැබිණි. ඉන් තුනක් තෝරා ගෙන ප්‍රදානයන් ලබාදෙනු ලැබීය. රාජ්‍ය-පෞද්ගලික සහයෝගීතා ව්‍යාපෘති 10ක් ක්‍රියාත්මකව පැවතිණි.

උග්‍ර ජාතික ගැටළු සඳහා පර්යේෂණ හා සංවර්ධන මැදිහත්වීම තුලින් දිගුකාලීන විසඳුම් සොයා ගැනීම සඳහා ඉලක්ක මත පදනම් වූ බහුවිෂයානුබද්ධ පර්යේෂණ වැඩසටහන (TO) 2013 වසරේදී ආරම්භ කරනු ලැබීය. මෙම වර්ෂය තුලදී ලද පූර්ව යෝජනා අයදුම්පත් 25න් නාගරික අපජලය, කුඩා හා මධ්‍ය පරිමාණ විවෘත කසළ බැහැර කිරීම් සඳහා විසඳුමක් පිළිබඳ වන එක් යෝජනාවක් සඳහා එක් ප්‍රදානයක් ලබාදෙනු ලැබීය.

ක්‍රියාත්මකව පවතින ව්‍යාපෘති අටක් ඇගැයීම සහ සුපරීක්ෂණය සඳහා වර්ෂය තුළදී ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්විණි.

2017 සැප්තැම්බර්/ඔක්තෝබර් කාල සීමාවේදී, 2018 වසර සඳහා මෙම ප්‍රදාන යොජනා ක්‍රම ත්‍රිත්වය යටතේ අයැදුම්පත් කැඳවීමට පියවර ගැනීම නව මූලාරම්භයක් වූ අතර ඒ හරහා අයැදුම්පත් ඇගැයීමට වැඩි කාලයක් ලැබෙන අතර වසර ආරම්භයේදී ප්‍රදානයන් පිරිනැමීමටද හැකිවේ.

විද්‍යාත්මක ප්‍රකාශන සඳහා ජනාධිපති සම්මාන ප්‍රදාන (PASP) වැඩසටහන සම්පාදනය කොට ඇත්තේ, පර්යේෂණ අංශයෙන් ජාත්‍යන්තර තත්ත්වයන් කරා ළඟාවී ඇති විද්‍යාඥයින් නිසි ඇගැයීමට ලක්කිරීමේ මුඛ්‍ය අරමුණ පෙරදැරි කර ගනිමිනි. විද්‍යාත්මක ප්‍රකාශන සඳහා ජනාධිපති සම්මාන යනු, ජාතික පර්යේෂණ සභා දින දර්ශනයේ වාර්ෂික අංගයකි. මෙම උළෙල විද්‍යා දිනය හා සමගාමීව නොවැම්බර් මසදී පවත්වනු ලැබේ. 2016 වර්ෂයේ ප්‍රකාශිත විද්‍යාත්මක ප්‍රකාශන සඳහා ජනාධිපති සම්මාන ප්‍රදානෝත්සවය 2018 නොවැම්බර් මස 19 දින, අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි. මෙහිදී විද්‍යාඥයින් 338දෙනෙකු සඳහා උපහාර පිරිනැමිණි.

2017 වසරේදී ඇරඹී "පොලිතීන් තිරසර කළමනාකරණය" පිළිබඳ සමාජ සුභසාධන වැඩසටහන වැඩසටහන අඛණ්ඩව 2018 වසරේදී උතුරු මැද පළාතේ පාසල් 800ක දී පවත්වන ලදී. ගුරුවරුන් සඳහා පොලිතීන් කළමනාකරණය පිළිබඳ වැඩමුළු ගණනාවක් පවත්වනු ලැබූ අතර වසරේ අවසන් භාගයේදී උතුරු මැද පළාතේ සංචාරයක නිරතවෙමින් ශ්‍රී ලංකා ජාතික විද්‍යා ඇකඩමිය මගින් ජාතික පර්යේෂණ සභාව විසින් පවත්වන ලද වැඩමුළු වල බලපෑම ඇගයීම ආරම්භ කරනු ලැබීය. විශ්ව විද්‍යාල ශිෂ්‍යයින් සමීක්ෂණය පැවැත්වීම සඳහා සහභාගි විය.

වැදගත් පර්යේෂණ සොයාගැනීම් පිළිබඳ මහජනතාව දැනුම්වත් කිරීම සඳහා පුවත්පත් ලිපි 12කට වැඩි සංඛ්‍යාවක් ප්‍රකාශයට පත්කරන ලදී.

දැනුම වර්ධනය අරමුණු කරගත් සහ සමස්ත ප්‍රජාවට ප්‍රතිලාභ අත්කර දෙන අන්දමේ උසස් තත්ත්වයේ පර්යේෂණයන් සඳහා මූල්‍යාධාර ලබාදීමට ජාතික පර්යේෂණ සභාව සෑමවිටම කැපවී සිටී.

වර්ෂය මුළුල්ලේ අප වෙත ලබාදුන් සහාය වෙනුවෙන් කවුන්සිලයේ සාමාජිකයටත්, මහා භාණ්ඩාගාරයේ සහ විද්‍යා, තාක්ෂණ සහ පර්යේෂණ අමාත්‍යාංශ නිලධාරීන්ටත් මාගේ කෘතඥතාවය පිරිනැමීමට කැමැත්තෙමි. එමෙන්ම, වසර පුරාවට නොමඳ සහාය ලබාදුන් ජාතික පර්යේෂණ සභාවේ කාර්ය මණ්ඩලයටද මාගේ ස්තූතිය හිමිවේ.

මනීෂා සී. රාජපක්ෂ
ප්‍රධාන විධායක නිලධාරි

පසුගිය වර්ෂ 3 සඳහා අදාළ මූල්‍ය සුවිශේෂීතාවයන්

වැඩසටහන් (ක්‍රමෝපායන්)		භෞතික ප්‍රගතිය			මූල්‍යමය ප්‍රගතිය රු. මිලියන		
	දර්ශකය	2016	2017	2018	2016	2017	2018
ජාතික පර්යේෂණ සභාවේ පොදු පරිපාලනය					17.6	20.99	22.80
පහත වැඩසටහන් සඳහා සංවර්ධන ආධාර					230.00	178.63	161.27
ඉලක්ක මත පදනම් වූ බහුවිෂයානුබද්ධ පර්යේෂණ වැඩසටහන (2014 වසරේදී ආරම්භ කරන ලදී)	වැඩසටහන් සංඛ්‍යාව	වැඩසටහන් 2ක් ආරම්භ කරන ලදී.	එක් වැඩසටහනක් ආරම්භ කරන ලදී.	එක් වැඩසටහනක් ආරම්භ කරන ලදී.			
පෞද්ගලික රාජ්‍ය සහයෝගීතා වැඩසටහන (2013 වසරේදී ආරම්භ කරන ලදී)	වැඩසටහන් සංඛ්‍යාව	වැඩසටහන් 3ක් ආරම්භ කෙරිණි. නිෂ්පාදන 2ක් දියත් කරන ලදී.	වැඩසටහන් 2ක් ආරම්භ කරන ලදී.	වැඩසටහන් 3ක් ආරම්භ කරන ලදී.			

අන්වේෂක මත පදනම් වූ ප්‍රදාන වැඩසටහන (1999 වර්ෂයේදී ආරම්භ කෙරිණි)	පිරිනමන ලද පර්යේෂණ ප්‍රදාන සංඛ්‍යාව පිරිනමන ලද ආචාර්ය උපාධි/ දර්ශනපති උපාධි අධිශිෂ්‍යත්ව	අන්වේෂක මත පදනම් වූ ප්‍රදාන 34ක් පිරිනැමීම. ආචාර්ය උපාධි/ දර්ශනපති උපාධි අධිශිෂ්‍යත්ව 19ක් පිරිනැමීම.	අන්වේෂක මත පදනම් වූ ප්‍රදාන 32ක් පිරිනැමීම. ආචාර්ය උපාධි/ දර්ශනපති උපාධි අධිශිෂ්‍යත්ව 27ක් පිරිනැමීම.	අන්වේෂක මත පදනම් වූ ප්‍රදාන 24ක් පිරිනැමීම. පරිසර හිතකාමී වල් පැලෑටි පාලනය 04 (EWC) සඳහා විශේෂ ප්‍රදානයන් පිරිනමනු ලැබිය. ආචාර්ය උපාධි/ දර්ශනපති උපාධි අධිශිෂ්‍යත්ව 23ක් පිරිනැමීම.	-	-	-
විද්‍යාත්මක ප්‍රකාශන වැඩසටහන සඳහා ජනාධිපති සම්මාන (PASP) (2001 වර්ෂයේදී ආරම්භ කෙරිණි)	පවත්වනු ලැබූ උත්සව හා සම්මානලාභී විද්‍යාඥයින් සංඛ්‍යාව	2014 වර්ෂයේ ප්‍රකාශන සඳහා ජනාධිපති සම්මාන ප්‍රදානය කිරීමේ උළෙල පවත්වන ලද අතර විද්‍යාඥයින් 232 දෙනෙකු සඳහා සම්මාන ප්‍රදානය කරන ලදී.	2015 වර්ෂයේ ප්‍රකාශන සඳහා PASP පවත්වන ලද අතර විද්‍යාඥයින් 295 දෙනෙකු සඳහා සම්මාන ප්‍රදානය කරන ලදී.	2016 වර්ෂයේ ප්‍රකාශන සඳහා PASP පවත්වන ලද අතර විද්‍යාඥයින් 338 දෙනෙකු සඳහා සම්මාන ප්‍රදානය කරන ලදී.	-	-	-
වෙනත් වැඩසටහන්: සමාජ සුභසාධන/ මහජනතාව දැනුම්වත් කිරීමේ වැඩසටහන්	සම්පූර්ණ කරනු ලැබූ ක්‍රියාකාරකම්	සමාජ සුභසාධන වැඩසටහන් 4ක් පවත්වන ලදී. ජාතික පර්යේෂණ සභාව විසින් පවත්වනු ලැබූ පර්යේෂණයන් පිළිබඳ පුවත්පත් ලිපි 50ක් ප්‍රකාශයට පත්කරන ලදී.	සමාජ සුභසාධන වැඩසටහන් 6ක් පවත්වන ලදී. ජාතික පර්යේෂණ සභාව විසින් පවත්වනු ලැබූ පර්යේෂණයන් පිළිබඳ පුවත්පත් ලිපි 40ක් ප්‍රකාශයට පත්කරන ලදී.	සමාජ සුභසාධන වැඩසටහන් 8ක් පවත්වන ලදී. ජාතික පර්යේෂණ සභාව විසින් පවත්වනු ලැබූ පර්යේෂණයන් පිළිබඳ පුවත්පත් ලිපි 18ක් ප්‍රකාශයට පත්කරන ලදී.	-	-	-
එකතුව					247.60	199.62	184.07

ජාතික පර්යේෂණ සභාවේ වැඩසටහන්

ඉලක්ක මත පදනම් වූ බහුවිෂයානුබද්ධ පර්යේෂණ ප්‍රදාන:

ගැටලු පිළිබඳ අවබෝධය ඉහළ නැංවීම හෝ සංකීර්ණ ගැටලු විසඳාලීම සඳහා හුදකලාවූ පර්යේෂණ හරහා හැකියාව ලැබෙනුයේ අල්ප වශයෙනි. බහුවිෂයානුබද්ධ ප්‍රවේශයක් අනුගමනය කිරීමෙන් සාමාන්‍ය සීමාවන්ට පරිබාහිර ගැටලු නැවත අර්ථදැක්වීම සහ දුෂ්කර ගැටලු අලුතින් අවබෝධ කරගැනීම හරහා විසඳුම් වෙත එළැඹීමට හැකිවන පරිදි බහුවිධ විෂයයන් වෙතින් සුදුසු පරිදි දායකත්වයන් ලබා ගැනේ.

මෙම වැඩසටහන 2013 වර්ෂයේදී ආරම්භ කරන ලද අතර විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය විසින් යෝජිත පර්යේෂණ හා සංවර්ධන මැදිහත්වීම් ඉතා කඩිනමින් අවශ්‍ය වන, අතිශය වැදගත් අංශයන් දහයක් හා අනුගතව ක්‍රියාත්මක කෙරිණි.

රාජ්‍ය විද්‍යාත්මක පර්යේෂණ හා සංවර්ධන ආයතන සහ විශ්වවිද්‍යාලයන්හී පර්යේෂක පිරිස් වෙතින් පූර්ව යෝජනා කැඳවන ලදී. ආර්ථික සංවර්ධනය, සමාජ සුභසාධනය සහ රටෙහි පාරිසරික තිරසරභාවය අරමුණු කරගනිමින්, ජාතික වශයෙන් අදාළත්වයක් සහිත ගැටලු විසඳාලීම මෙම ඉලක්ක මත පදනම් වූ බහුවිෂයානුබද්ධ පර්යේෂණ ව්‍යාපෘති හරහා සිදුකිරීමට අපේක්ෂිතය.

ප්‍රතිපත්ති/ ක්‍රමෝපාය හෝ නිෂ්පාදන වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය දැනුමෙහි පවතින ප්‍රධාන පරතරයන් විසඳාලීම, දේශයෙහි ප්‍රගමනය සඳහා බාධක හෝ අභියෝග එල්ල කෙරෙන ගැටලු විසඳාලීම මෙම ව්‍යාපතීන්හි අරමුණු වේ. පර්යේෂණ ප්‍රතිඵල ප්‍රතිපත්ති, ක්‍රමෝපායයන්, නිෂ්පාදන/ ක්‍රියාවලි වැඩිදියුණු කිරීම සහ ඒවා පිළිබඳ අවබෝධයක් ලබාගැනීම සඳහා වන ගමන් මඟ පැහැදිළිව හඳුනාගත යුතුය.

විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයේ ජාතික පර්යේෂණ හා සංවර්ධන ප්‍රතිපත්ති රාමුව (වැදගත් ක්ෂේත්‍ර දහයක්) සමඟ අනුගත වෙමින් ප්‍රමුඛ ක්ෂේත්‍රයන් කිහිපයක් වෙතින් යෝජනා කැඳවනු ලැබිණි. එක් ප්‍රදානයක වටිනාකම මිලියන 50ක් වන අතර වසර 5ක කාලසීමාවක් සඳහා මෙම ප්‍රදානයන් සිදුකරයි. ජාතික පර්යේෂණ සභාව විසින් සැලකිය යුතු අන්දමේ මහජන මුදල් ප්‍රමාණයක් මෙම ව්‍යාපෘතීන් සඳහා ආයෝජනය කරන හෙයින්, මේ සඳහා මූල්‍යනය ඉතා ඉහළ තරඟකාරී පදනමකින් සිදුකෙරෙනු ඇත. වසර 5ක කාලයකට පසු සැලකියයුතු අන්දමේ ප්‍රතිඵලයක් ලබාදීමේ හැකියාවක් ඇති බවට ජාතික පර්යේෂණ සභාව විසින් සලකනු ලබන, ව්‍යාපෘතීන්හී කණ්ඩායමක් වශයෙන් එක්ව ක්‍රියා කළ හැකි කුසලතා සහිත, ඉතා සුදුසු පර්යේෂකයින් පමණක් තෝරාගැනීමට ජාතික පර්යේෂණ සභාව විසින් කටයුතු කෙරෙනු ඇත. පර්යේෂණයන්හී විවිධ අංශයන් පිළිබඳව කණ්ඩායමේ සාමාජිකයින් විසින් සමගාමීව කටයුතු කිරීමේ වාසිය මෙම බහුවිෂයයන් මත කේන්ද්‍රගත වූ ව්‍යාපෘති හරහා උදාවනු ඇත.

ප්‍රදානයෙහි මෙහෙයුම් සැලසුම් අන්වේෂක මත පදනම් වූ ප්‍රදානයන්ට බෙහෙවින් සමානවේ. කෙසේ වුවද, ප්‍රධාන අන්වේෂකට අමතරව නියෝජ්‍ය කායකයෙකුද පත්කෙරෙනු ඇත. මෙම ප්‍රදාන සිදුකිරීමෙන් අනතුරුව, ප්‍රකාශිත ප්‍රතිඵලයන් ළඟාකරගන්නා බවට සහතික කරනු පිණිස මෙම ව්‍යාපෘතීන් විධිමත් හා දැඩි නිරීක්ෂණයන්, සුපරීක්ෂණයන් සහ ඇගැයීම්වලට ලක්කරනු ඇත.

අන්වේෂක මත පදනම් වූ පර්යේෂණ ප්‍රදාන වැඩසටහන

ශ්‍රී ලංකාවේ රාජ්‍ය ආයතන සහ විශ්වවිද්‍යාල විසින් සිදු කෙරෙන පර්යේෂණ හා සංවර්ධන ක්‍රියාකාරකම් සඳහා ප්‍රධාන වශයෙන් මූල්‍යාධාර සැපයෙනුයේ රාජ්‍ය ආයතනික ප්‍රතිපාදන, තරඟකාරී ප්‍රදාන සහ පර්යේෂණ ගිවිසුම් වැනි විවිධ ප්‍රභවයන් වෙතිනි. ජාතික පර්යේෂණ සභාවේ පර්යේෂණ ප්‍රදාන වැඩසටහන ආරම්භ කරනු ලැබුයේ විද්‍යාඥයින්ගට අවම පරිපාලන අවහිරතා යටතේ සිය පර්යේෂණ කාර්යයන්හී නියැලීමට ඉඩ ප්‍රස්ථා ලබා දීමේ අරමුණෙනි.

ජාතික පර්යේෂණ සභාවෙහි පර්යේෂණ ප්‍රදාන වැඩසටහන හරහා රජයේ ආයතන සඳහා පර්යේෂණ සහ සංවර්ධන ක්‍රියාකාරකම් සිදු කිරීම පිණිස තරඟකාරී ප්‍රදානයන් ලබා දීම සිදු කෙරේ. මෙම වැඩසටහන ක්‍රියාත්මක වූ කාලසීමාව තුල එය ක්‍රමවත් කරනු ලැබූ අතර එය දැන් වැඩි හෝ අඩු වශයෙන් විධිමත්වේ. මෙම ප්‍රදානයන් පිළිබඳව වාර්ෂිකව දැන්වීම් පළකෙරෙන අතර, විද්‍යාත්මක දැක්ම, ජාතික සංවර්ධනය සඳහා ඇති අදාලත්වය සහ ජාත්‍යන්තර සහරාවන්හී මෙම සොයාගැනීම් පළවීම යන කරුණු මත ඇගයීම සිදු කෙරේ.

අයැදුම්පත් දැඩි ඇගයීමේ ක්‍රියාවලියකට ලක් කෙරේ. තෝරාගනු ලබන යෝජනාවන් සඳහා සුදුසු පරිදි ප්‍රතිපාදන වෙන්කිරීම් පිළිබඳව සභාව විසින් තීරණය කෙරෙනු ලබන අතර මෙම ප්‍රතිපාදන මහා භාණ්ඩාගාරයේ සිට ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ තනි වගකීම දරණ ප්‍රධාන විමර්ශකයා වෙත සෘජුවම ලබාදේ. උපකරණ සහ පාරිභෝගික ද්‍රව්‍ය ආදිය සඳහා මෙම ප්‍රතිපාදන වෙන්කෙරේ. එක් එක් ව්‍යාපෘතිය සඳහා බැංකු ගිණුමක් විවෘත කෙරෙන අතර ජාතික පර්යේෂණ සභාව විසින් සියළු ගණුදෙණු අධීක්ෂණය කෙරේ. පරිපාලන අවහිරතා අවම මට්ටමක තබා ගිනිමින් මෙම අරමුදල් ප්‍රයෝජනයට ගැනීම සඳහා සැලකිය යුතු අන්දමේ නම්‍යශීලීතාවයක් මේ හරහා විද්‍යාඥයින්ට ලැබේ. ජාතික පර්යේෂණ සභාවෙහි කමිටු මණ්ඩලය, ප්‍රමුඛ කාර්යාලය මඟින් අධීක්ෂණය සහ ඇගැයීම සිදු කෙරේ.

වත්මන් ප්‍රදානයන් ස්වභාවයෙන් විවිධාකාර වන බව මෙහිදී සඳහන් කළ යුතුය. මූලික විද්‍යාත්මක ප්‍රස්තුතයන්, ආහාර, ජලය, පරිසරය හා බලශක්ති යන ක්ෂේත්‍ර පිළිබඳව පර්යේෂණ මූල්‍යයනය කිරීමට අමතරව ජාතික පර්යේෂණ සභාව විසින් පසු කාලීනව ජාතික සුපරීක්ෂණය, වාරිමාර්ග පද්ධතීන්, වනජීවී සහ පරිසර හිතකාමී සංචාරක කර්මාන්තය, කථන පරිවර්තනය, ඉදිකිරීම් සහ ගෘහ නිර්මාණ ශිල්පය, දුම්රිය ගමනාගමනය, ක්‍රීඩා සහ තවත් බොහෝමයක් ක්ෂේත්‍රයන්හි පර්යේෂණ සඳහා මූල්‍යයනය කෙරේ.

සියලුම වැඩසටහන් සඳහා සරල සහ අංගසම්පූර්ණ අයදුම්පත්‍ර කට්ටලයක් පවතී. වසර තුළදී ජාතික පර්යේෂණ සභාව වෙත ලැබෙන අයදුම්පත්‍ර සංඛ්‍යාවේ ක්‍රමික වැඩිවීමක් පෙන්නුම් කර ඇති අතර මෙය ධනාත්මක සලකුණකි. මෙම වැඩසටහන හමුවේ ඇති අභියෝගය වනුයේ දැනටමත් ජාතික පර්යේෂණ සභාව විසින් අත් කරගනු ලැබ ඇති ගම්‍යතාවය එලෙසින් පවත්වාගෙන යාමයි

මෙම ප්‍රදානයන් වෙතින් උපරිම ප්‍රතිඵල ලබාගැනීමට හැකිවන අයුරින් ඒවායේ ප්‍රගතිය සුපරීක්ෂණය සහ ඇගැයීම සඳහා කමිටු මණ්ඩලය විසින් නව නීති රීති සහ මාර්ගෝපදේශ ගණනාවක් හඳුන්වා දෙන ලදී.

පරිසර හිතකාමී වල් පැලෑටි පාලන ක්‍රම සඳහා විශේෂ ප්‍රදානයන්: වල්නාශකයක් ලෙස ග්ලයිපොසේට් (Glyphosate) භාවිතය සඳහා ඇති අඛණ්ඩ නෛතික බාධාවන් පිලිබඳ සලකා බලා කෘෂිකාර්මික භෝග වගාවේදී වල් පැලෑටි පාලනය සඳහා ඇති විකල්ප පුළුල් කිරීම අවශ්‍ය වේ. මෙයට රසායනික නොවන ක්‍රමවේද ගණනාවක් හා රසායනික විකල්ප කීපයක් ඇතුලත්වේ. භෝග කළමනාකරණයේ පිළිගත් මූලධර්මයන්ට අනුඅකූලව සුදුසු පරිදි තෝරාගත් විට හා එක් එක් වගා තත්වයන් සඳහා උපරිම ලෙස යොදාගත් විට ඉහත විකල්පයන්ගෙන් සමහරක් සමෝධානය කිරීම (සමෝධානික වල් පැලෑටි කළමනාකරණය ලෙස හැඳින්වේ) හරහා ඵලදායි ලෙස වල් පැලෑටි පාලනය සිදුකල හැක. එමනිසා, ඔවුන්ගේ අදාල භෝග වර්ගය සඳහා ඵලදායී හා ආර්ථිකමය අතින් වාසිදායි ලෙස වල්පැලෑටි පාලනය කිරීම සඳහා ගොවීන්ට/ වැවිලිකරුවන්ට භාවිතා කළ හැකි මට්ටමකට ඉහත ක්‍රමවේද වැඩිදියුණු කිරීම වේගවත් කිරීම සඳහා විශේෂ අවධානය යොමුවූ පර්යේෂණ සඳහා සහය දීමේ හදිසි අවශ්‍යතාවයක් පවතී. ඒ අනුව, පරිසර හිතකාමී වල් පැලෑටි පාලනය කිරීමේ (EWC) වැඩසටහන යටතේ විශේෂ ව්‍යාපෘති හතරක් සඳහා මූල්‍යාධාර ලබාදී ඇත. පර්යේෂණ වැඩිදියුණු කිරීම සතුටුදායක මට්ටමකට ලඟාවූ විට පරිමාව වැඩිකිරීම හා වාණිජකරණය සඳහා සහය ලබාදෙනු ඇත.

විද්‍යාත්මක ප්‍රකාශන වැඩසටහන සඳහා ජනාධිපති සම්මාන

ජාත්‍යන්තර තලය කරා ළඟාවූ විද්‍යාඥයින්ට බුහුමන් දැක්වීම, ජාතික විද්‍යාත්මක නිෂ්පාදනයන් ඉහළ නැංවීම යන අභිමතාර්ථයන් පෙරදැරිව පර්යේෂණ සඳහා ජනාධිපති සම්මාන ප්‍රදාන වැඩසටහන 2001 වසරේදී ආරම්භ කරනු ලැබිය. 1991 සිට මේ දක්වා විද්‍යාත්මක ප්‍රකාශන එළිදැක්වීම පිළිබඳ ජාතික සංඛ්‍යාලේඛන මඟින් අනාවරණ වන්නේ ගුණාත්මක විද්‍යාත්මක ප්‍රකාශනවල සංඛ්‍යාවේ ඉහළ නැඟීමේ ප්‍රවනතාවයෙහි මූලාරම්භය විය හැකිය.

මෙම සම්පූර්ණ ක්‍රමවේදය ප්‍රසාරිත විද්‍යා සඳහන් දර්ශකය (SCIE) මත පදනම්ව ඇත. SCIE යනු, විද්‍යාව මත ඇති කෙරෙන බලපෑම සහ තත්වය හා අදාලව ප්‍රකාශකයින් විසින් ලෝකයේ ඉහළම තත්ත්වයෙහි ලා සැලකෙන විද්‍යාත්මක සඟරාවන්හී දත්ත ගබඩාවයි. මෙලෙස SCIE විසින් මෙම වර්ෂයකදී සඟරා 14000ක් පමණ විශ්ලේෂණයට ලක් කෙරේ.

පර්යේෂණ සම්මාන ප්‍රදාන යෝජනා ක්‍රමය සඳහා පිළියෙල කරණ ලකතුවට සමාජ විද්‍යාව හැර SCIE හි දක්වා ඇති පරිදි අවම වශයෙන් එක් ශ්‍රී ලංකීය ලිපිනයක් සහිත සියළු "සංකීර්ණ විද්‍යා" මාතෘකා වලින් සමන්විතවේ.

2016 වසර සඳහා එකී දර්ශකයෙහි ශ්‍රේණිගත සඟරාවන්හී පළවූ ප්‍රකාශනයන් සඳහා විද්‍යාඥයින් 338 දෙනෙකුට 2018 වසරේදී සම්මාන පිරිනැමිණි.

රාජ්‍ය පෞද්ගලික සහයෝගීතා වැඩසටහන

ශ්‍රී ලංකාවේ අපේක්ෂිත ආර්ථික සංවර්ධන අරමුණු ළඟා කර ගැනීමේදී අත්‍යාවශ්‍ය සාධකයක් වන, ගෝලීය වෙළඳපළ තුළ තරඟකාරීවන අගය එකතු කළ නිෂ්පාදන හා සේවාවන් වැඩිදියුණු කිරීම සඳහා විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රයේ පර්යේෂණ හා සංවර්ධනයන් මග සලසනු ඇත. මෙම අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා, ශ්‍රී ලංකාව තුළ සිදු කෙරෙන පර්යේෂණ, ආර්ථිකයේ ප්‍රගමනයට ඉවහල් වන, ප්‍රධාන කර්මාන්තයන්හී අවශ්‍යතාවන් සපුරාලන ඉල්ලීම් මත පදනම් වූ පර්යේෂණ විය යුතුය.

රාජ්‍ය-පෞද්ගලික දෙඅංශයේ සහයෝගීතා (PPP) වැඩසටහන මඟින්, රටෙහි ආර්ථික සංවර්ධනය කෙරෙහි දායකත්වයක් ලැබෙන පරිදි පර්යේෂණ හා සංවර්ධන ක්‍රියාකාරකම් සහ කර්මාන්තයන්හී ප්‍රධාන හවුල්කරුවන් සම්බන්ධ කිරීම සිදුකෙරේ. විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රයේ පර්යේෂණ හා සංවර්ධනයන් ප්‍රවර්ධනය තුලින් අපනයන ආදායම් ඉහළ නැංවීම, අපනයන භාණ්ඩ විවිධාංගීකරණය සහ ආනයන ආදේශක ප්‍රවර්ධනය හරහා ආර්ථික සංවර්ධනය ළඟාකර ගැනීමේ හැකියාව පවතී. නව්‍ය හෝ වඩා හොඳ තත්ත්වයේ නිෂ්පාදන, ක්‍රියාවලි, සේවාවන්, අගය එකතුකිරීම්, වාණිජමය හැකියාවන් සහිත තාක්ෂණික ගැටළු විසඳීම යනාදිය කෙරෙහි යොමුවූ සියළු නවෝත්පාදක පර්යේෂණයන් මෙම වැඩසටහන සඳහා සලකා බැලෙනු ඇත. විවිධ අංශයන් අතර ඇති කරගනු ලබන සහයෝගීතාවයන් තුලින් කාර්මික පර්යේෂණ සහ සංවර්ධන අවශ්‍යතාවයන් සඳහා විසඳුම් සොයාගනු පිණිස අපගේ පර්යේෂණ විශේෂඥතාවය, වියදම්, සේවාවන් සහ පහසුකම් වඩා ඵලදායී අයුරින් බෙදාහදා ගැනීමට හැකියාව ලැබේ. මෙම සහයෝගීතාවයන් හරහා රාජ්‍ය අංශයේ පර්යේෂණ සහ සංවර්ධන ක්‍රියාකාරකම්හි කාර්යක්ෂමතාවය වැඩිදියුණු කෙරෙනු ඇති අතර ඒ සඳහා ගතවන කාලයද අඩු වනු ඇත. රාජ්‍ය අංශයේ සහභාගිත්වය සහිත ව්‍යාපාරයක් මඟින් සිදුකරණ පර්යේෂණ හා සංවර්ධන වියදම්වලට අදාලව බදු සහන ලබාදීම හරහා පෞද්ගලික අංශයේ සහයෝගීතාවය දිරිගැන්වේ. ජාතික අවශ්‍යතාවයන් සඳහා පර්යේෂණ මත පදනම් වූ විසඳුම් ලබාදීම සඳහා ජාතික පර්යේෂණ සභාව විසින් රජය - දේශීය ආයතන - අමාත්‍යාංශ - විශ්වවිද්‍යාල - පර්යේෂණ හා සංවර්ධන ආයතන - ව්‍යාපාරික අංශය - කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ක්ෂේත්‍රය යන අංශයන් අතර සම්බන්ධීකරණය සිදු කෙරේ.

<u>වෙනත් වැඩසටහන්</u>

සුභසාධක වැඩසටහන් - විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයේ මෙහෙයවීම යටතේ සෑම කාර්තුවකම මහජනතාව වෙත පර්යේෂණ ප්‍රදානයන්හී ප්‍රතිලාභයන් ලබාදීමේ අරමුණින් සුභසාධක වැඩසටහනක් පවත්වන ලදී.

මහජන දැනුම්වත් කිරීමේ වැඩසටහන් - තම පර්යේෂණයන් විද්‍යාඥයින් විසින් සමාලෝචනය කෙරෙනු ලබන සහරාවන්හී පළකිරීම සඳහා ප්‍රදානලාභීන් දිරිගන්වනු ලැබේ. ඒ අතරම විද්‍යාඥයින් විසින් සිදු කරනු ලබන පර්යේෂණයන් පිළිබඳව මහජනතාව දැනුම්වත් කිරීම අරමුණු කරගනිමින් සිය සොයාගැනීම් පුවත්පත්වල පළකිරීම සඳහා ජාතික පර්යේෂණ සභාව විසින් විද්‍යාඥයින්ට පහසුකම් සලසනු ලැබේ.

2018 වසරේ විශේෂ අවස්ථා

ඉලක්ක මත පදනම් වූ බහුවිෂයානුබද්ධ පර්යේෂණ ප්‍රදාන

2018 ඔක්තෝම්බර් මාසයේදී ජාතික පර්යේෂණ සභාව විසින් නගර සභාවේ කාබනික සණ අපද්‍රව්‍ය කාබනිකරණය කරණ ලද ද්‍රව්‍ය බවට පරිවර්තනය කිරීමේ එක් ව්‍යාපෘතියක් සඳහා ආධාර දෙනු ලැබීය.

	2014	2016	2018
ලැබූ අයැදුම්පත් සංඛ්‍යාව	60	50	25
විස්තරාත්මක යෝජනා සඳහා අවසන් කෙටි ලේඛනගත කරනු ලැබූ අයැදුම්පත් සංඛ්‍යාව	21	11	06
ඉදිරිපත් කිරීම් සඳහා අවසන් කෙටි ලේඛනගත කරනු ලැබූ අයැදුම්පත් සංඛ්‍යාව	11	06	03
පිරිනමන ලද ප්‍රදානයන් සංඛ්‍යාව	05	03	01

2014, 2016 හා 2017 වර්ෂයන්හීදී පිරිනමන ලද ඉලක්ක මත පදනම් වූ බහුවිෂයානුබද්ධ ප්‍රදානයන් අටක් 2018 වසර තුළදී ක්‍රියාත්මකව පැවති අතර, ජාතික පර්යේෂණ සභාවේ ව්‍යාපෘති අධීක්ෂණ උපදේශක, මහාචාර්ය ආර්.බී. මාපා මහතා විසින් තෙවන වසරටද ප්‍රගතිය අධීක්ෂණය කරන ලදී.
දැනට ක්‍රියාත්මකව පවතින ඉලක්ක මත පදනම් වූ ප්‍රදාන:

- **වාහකයින් පාලනය භාවිතයෙන් ශ්‍රී ලංකාවේ ඩෙංගු පාලනය සඳහා මෙහෙයුම් ආකෘතියක්, ආරක්ෂක නිෂ්පාදන වැඩිදියුණු කිරීම සහ ප්‍රජාවන් ඒකරාශි කිරීම පිළිබඳ අංගසම්පූර්ණ පර්යේෂණ යෝජනාවක්**

  (ප්‍ර:අ: ආචාර්ය එම්. හපුගොඩ සහ නියෝජ්‍ය ප්‍ර:අ: ආචාර්ය නිල්මිණී ගුණවර්ධන, කැළණිය විශ්වවිද්‍යාලය)
  මෙම ව්‍යාපෘතියේ අරමුණ වනුයේ, ස්වාභාවික අභිජනන වාසස්ථාන අවම කිරීම, නැනෝ තාක්ෂණය භාවිතයෙන් නිපදවූ කෘමිනාශක මගින් ප්‍රතිකර්ම කරන ලද ජනේල තිරරෙදි සහ මදුරු දැල් භාවිතයෙන් මදුරුවන් දෂ්ඨ කිරීම අවම කිරීම සහ ඩෙංගු පාලනය සඳහා ප්‍රජා සහභාගීත්වය වැඩිදියුණු කිරීම හරහා රසායන විද්‍යාත්මකව සහ ජෛව විද්‍යාත්මකව ඩෙංගු වාහකයින් පාලනය කිරීමයි.



ශ්‍රී ලංකාවේ සර්ප දෂ්ඨ කිරීම් සඳහා බහුසංයුජතා ප්‍රතිවිෂ වර්ගයක් වැඩිදියුණු කිරීම

(ප්‍ර:අ: මහාචාර්ය අයි.බී. ගවරම්මාන සහ නියෝජ්‍ය ප්‍ර:අ: ආචාර්ය ඒ. දංගොල්ල, පේරාදෙණිය විශ්වවිද්‍යාලය)

නවීන තාක්ෂණික සර්පාගාරයක් වැඩිදියුණු කිරීම හරහා ශ්‍රී ලංකාවේ, වෛද්‍ය විද්‍යාත්මක වැදගත්කමකින් යුත් සර්පයින්ගේ විෂ එක්රැස් කිරීම, විශ්ලේෂණය, ශ්‍රී ලංකාවේදී දෂ්ටනය සඳහා බහුසංයුජතා ප්‍රතිවිෂ වර්ගයක් වැඩිදියුණු කිරීම සහ ශ්‍රී ලංකාවේදී ප්‍රතිවිෂ නිෂ්පාදනය සඳහා අශ්වයින් යොදා ගැනෙන පර්යේෂණ සංකීර්ණයක් ස්ථාපනය කිරීම මෙහි අරමුණ වේ



කිරි නිෂ්පාදනය අතින් ස්වයංපෝෂී තත්ත්වය ළඟාකර ගැනීම සඳහා කිරි කර්මාන්තය වැඩිදියුණු කිරීම

(ප්‍ර:අ: කේ. මහීපාල මයා සහ නියෝජ්‍ය ප්‍ර:අ: ආචාර්ය තුසිත් සමරකෝන්, පේරාදෙණිය විශ්වවිද්‍යාලය)

මෙම ව්‍යාපෘතියේ අරමුණ වනුයේ, පෝෂණ කළමනාකරණය වැඩිදියුණු කිරීම, වඩා හොඳ ආහාර සූත්‍ර භාවිතා කිරීම, පැටවුන් බිහි කිරීමේ කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම, උපරිම ගැබ් ගැනීමේ ශීඝ්‍රතාවයක් සඳහා සම්මුහුර්තකරණ ක්‍රියාවලිය භාවිතය, දින 18-20 දී පූර්ව ගැබ් ගැනීම හඳුනාගැනීමේ අඩු වියදම් ක්ෂේත්‍ර කට්ටලයක් හඳුන්වා දීම, මැස්ටයිටිස් රෝගය සඳහා පොදු රෝග නිධාන හඳුනාගැනීම, රෝග හටගැනීම සහ ව්‍යාප්තිය අවම කිරීම සඳහා සුදුසු ප්‍රතිජීවක ඇසුරෙන් ප්‍රතිකාර කිරීම සහ සත්ත්ව සුභසාධනය වැඩිදියුණු කිරීම මගින් කෘෂිකර්මාන්තය සඳහා සුදුසු සියළු ප්‍රදේශවල කිරි ඵලදාව වැඩිකිරීමවේ.



- **ශ්‍රී ලංකාවේ ව්‍යාප්තව පවතින රෝග නිධානය හඳුනා නොගත් නිදන්ගත වකුගඩු රෝගය පිළිබඳ අංගසම්පූර්ණ අධ්‍යයනයක්.**

(ප්‍ර:අ: මහාචාර්ය ආර්.එල්.ආර්. චන්ද්‍රජීත් සහ නියෝජ්‍ය ප්‍ර:අ: මහාචාර්ය ජේ.ජී.එස්. රණසිංහ, පේරාදෙණිය විශ්වවිද්‍යාලය)

මෙහි මුඛ්‍ය පරමාර්ථය වනුයේ, දැනට සොයාගෙන නොමැති නිදන්ගත වකුගඩු රෝගයේ විවිධ ලක්ෂණ පිළිබඳ සොයාගැනීමයි. රෝගයේ ක්‍රමික වර්ධනය සහ මරණයට පත්වීම සඳහා බලපාන සාධක හඳුනාගැනීම සඳහා නිදන්ගත වකුගඩු රෝගයෙන් පෙළෙන රෝගීන්ගෙන් ලබාගත් රුධිර සහ මුත්‍ර සාම්පල විශ්ලේෂණය කරනු ලැබේ. රෝගය ව්‍යාප්තව පවතින ප්‍රදේශයන් වන ගිරාඳුරුකෝට්ටේ සහ විල්ගමුව යන ප්‍රදේශයන්හි අංගසම්පූර්ණ භූ පරිසර අධ්‍යයනයක් සිදුකරනු ලැබූ අතර ICPMS යන්ත්‍රය භාවිතයෙන් එම ප්‍රදේශ වල ළිං, වැව් සහ කුඹුරු ආදියෙන් ලබාගත් ජල සාම්පල බැර ලෝහ සඳහා විශ්ලේෂණය කරන ලදී. GIS අනුරූපනය භාවිතයෙන් මහවැලි ප්‍රදේශයන්හී පරිසර දූෂණය පිළිබඳ ඉතිහාසය සොයා බැලීම, මහජන දැනුම්වත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී.



- **ශ්‍රී ලංකාව තුළ විවිධ දේශගුණ තත්ත්වයන්ට ගැළපෙන භෝග ප්‍රභේද සහ වගාකිරීමේ ශිල්පීය ක්‍රම වැඩිදියුණු කිරීම හරහා ආහාර සුරක්ෂිතතාවය සහතික කිරීම.**
(ප්‍ර:අ: ආචාර්ය ඩබ්.එම්.ඩබ්. වීරකෝන් සහ නියෝජ්‍ය ප්‍ර:අ: ආචාර්ය ඩී.එම්.ජේ.බී. සේනානායක, ක්ෂේත්‍ර බෝග පර්යේෂණ සහ සංවර්ධන ආයතනය, මහඉලුප්පල්ලම)

  අධික උෂ්ණත්වයන්, ජල හිඟයට ඔරොත්තු දෙන, වැඩි ඵලදාවක් සහිත පළිබෝධ සහ රෝග සඳහා ඔරොත්තු දෙන/ප්‍රතිරෝධී මිරිස්, බඩඉරිඟු, මුං බීජ සහ සහල් ප්‍රභේද වැඩිදියුණු කිරීම, විවිධ දේශගුණ තත්ත්වයන්ට යෝග්‍ය කෘෂිකාර්මික භාවිතයන් යෝජනා කිරීම; පාංශු තෙතමන දර්ශක භාවිතයෙන් නියහයන්ට වඩාත් ලක්විය හැකි ප්‍රදේශ හඳුනාගැනීම සහ සිතියම්ගත කිරීම මෙම ව්‍යාපෘතියේ අරමුණුවේ.



- **ප්‍රමාණවත් ඵලදාවක් පවත්වා ගනිමින් සහ පාංශු සාරවත්භාවය වර්ධනය කරගනිමින් අකාබනික පොහොර භාවිතය අවම කරනු පිණිස පරිසර හිතකාමී වගා තාක්ෂණයන් වැඩිදියුණු කිරීම**
(ප්‍ර:අ: ආචාර්ය සමන් ධර්මකීර්ති, ආචාර්ය ඩබ්.එස්. දන්දෙනිය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය)

  මෙම ව්‍යාපෘතියේ මූලික අරමුණ වනුයේ, ශ්‍රී ලංකාවේ වී වගාවේදී රසායනික පොහොර භාවිතයේ කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම සහ ඒ හරහා රටෙහි රසායනික පොහොර භාවිතය අවම කරනු පිණිස පරිසර හිතකාමී සහ ගොවිජන හිතකාමී තාක්ෂණයන් වැඩිදියුණු කිරීමය. එමෙන්ම, ශාකවල මනා පැවැත්ම වැඩිදියුණු කිරීම හා වී වගා බිමෙහි වෙනත් කෘෂි රසායනයන්හි භාවිතය අවම කිරීම සඳහා මෙම තාක්ෂණයන්හි ඵලදායී යෙදවීම පිළිබඳ සොයාබැලීමද මෙමගින් අපේක්ෂිතය. පෞද්ගලික අංශයේ ආයෝජකයින් සමඟ ඇති කරගනු ලැබෙන සහයෝගීතාවයන් හරහා මෙම වැඩිදියුණු කරන ලද තාක්ෂණයන් ගොවීන් වෙත හඳුන්වා දෙනු ඇත.



- **භූගත ජලයේ දියවී ඇති සමස්ත ඝන ද්‍රව්‍ය සහ ෆ්ලුවොරයිඩ් සඳහා ප්‍රතිකර්ම යෙදීමේ පහසුකමක ආකෘතියක් වැඩිදියුණු කිරීම - වියළි කලාපීය පානීය ජල ගැටලු සඳහා තිරසර විසඳුමක්**
  (ප්‍ර:අ: මහාචාර්ය රොහන් වීරසූරිය, ආචාර්ය එස්.කේ. වේරගොඩ, ජාතික මූලික අධ්‍යයන ආයතනය)



වියළි කලාපයේ ජලයේ තත්ත්වය සම්බන්ධයෙන් පැනනැඟ ඇති ගැටලු සඳහා තිරසර විසඳුමක් ලබාදීම මෙම ව්‍යාපෘතියේ අරමුණයි. මේ යටතේ විද්‍යුත් ආතංචනය (electro-coagulation) සහ නිනිති පටල පෙරීමේ ක්‍රමය (nano membrane filtration) යොදා ගනිමින් ජලයේ අඩංගු අතිරික්ත ෆ්ලුවොරයිඩ සහ සමස්ත දියවූ ඝන ද්‍රව්‍ය නියාමනය කිරීම සඳහා යෝග්‍ය තාක්ෂණය සහිත ජංගම ප්‍රතිකර්ම පහසුකමක් තැනීමට යෝජිතය. මෙම යෝජිත ජල ප්‍රතිකර්ම ආකෘතිය ආරම්භයේදී කුඩා ගම්මාන සඳහා සීමාවනු ඇත. ජාතික ජල සම්පාදන සහ ජලාපවහන මණ්ඩලයේ පාලනය යටතේ, ජල ප්‍රභවය ආසන්නයේ පදිංචි ග්‍රාමීය පාරිභෝගිකයන් වෙත ඔවුන්ගේ එදිනෙදා පරිභෝජනය සඳහා මෙම පිරිසිදු ජලය බෙදාහැරීම සිදුකෙරෙනු ඇත. ජල හිඟයෙන් පීඩා විඳින ප්‍රජාවන්ගේ ගැටලු සඳහා කඩිනම් විසඳුමක් ලබාදීමේ අත්‍යාවශ්‍ය පළමු පියවරක් මේ හරහා තැබෙනු ඇත.

- **ජල පවිත්‍රීකරණය සඳහා උසස් ද්‍රව්‍ය මත පදනම් වූ පෙරහන් වැඩිදියුණු කිරීම**
  (ප්‍ර:අ: ආචාර්ය රෝහිණී ද සිල්වා, ආචාර්ය නලින් ද සිල්වා, කොළඹ විශ්වවිද්‍යාලය)

ජල පවිත්‍රීකරණ ක්‍රියාවලිය සඳහා ග්‍රාමීය ප්‍රජාව වෙත විදුලිය අවශ්‍ය නොවන, අඩු වියදම් සහ ඵලදායී ජල පෙරහනක්, සපයාදීම මෙහි ප්‍රධාන අරමුණයි. මෙම තිරසර ජල පවිත්‍රීකරණ පද්ධතිය දේශීය නිෂ්පාදකයෙකු

විසින් නිෂ්පාදනය කෙරෙනු ඇත. මෙහි නිර්මාණය කර ඇති බහුවිධ පද්ධතීන් විසින් බැක්ටීරියා, කාබනික දූෂක ද්‍රව්‍ය, බැරලෝහ සහ අනෙකුත් අකාබනික දූෂක ද්‍රව්‍ය ඉවත් කෙරෙනු ඇත.



.

- **දූෂණය අඩු කිරීම හා අගය එකතුකිරීම සඳහා මධ්‍යම හා කුඩා පරිමාණ විවෘත කසල ගොඩවල් සඳහා විස්තීර්ණ විසඳුමක්**
  (ප්‍ර:අ: ආචාර්ය මෙත්තිකා විතානගේ, ආචාර්ය බී.එල්.සී අතපත්තු මිය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය)

  නාගරික කාබනික සහ අපද්‍රව්‍ය කාබනීකෘත ද්‍රව්‍ය බවට පරිවර්තනය කිරීමට - මධ්‍යම හා කුඩා පරිමාණ විවෘත කසල බැහැරකිරීම් කළමනාකරණය සඳහා තිරසාර විස්තීර්ණ විසඳුමක්.



අන්වේෂක මත පදනම් වූ පර්යේෂණ ප්‍රදාන

2018 වර්ෂය ආරම්භ වූයේ ජාතික සියළුම විශ්වවිද්‍යාල, පීඨයන් සහ සියළුම රජයේ පර්යේෂණ හා සංවර්ධන ආයතන අතර සංසරණය කරන ලද පුවත් පත් දැන්වීමක් පළකිරීම හරහා පර්යේෂණ සභාවේ අන්වේෂක මත පදනම් වූ පර්යේෂණ ප්‍රදාන වැඩසටහන සඳහා අයැදුම්පත් කැඳවීමෙනි.

අයැදුම්පත් භාරගැනීමේ අවසාන දිනය 2017 නොවැම්බර් 27 වූ අතර අයැදුම්පත් 109ක් ලැබී තිබුණි. පළමු කාර්තුව තුළදී දැනට ක්‍රියාත්මක ප්‍රදානයන්ගේ වාර්ෂික ප්‍රගති වාර්තාවන් ඇගැයීම් සඳහා යවන ලදී.

මෙම ක්ෂේත්‍රය පිළිබඳ විශේෂඥ දැනුමකින් යුතු ඇගැයීමකරුවන් වෙත මෙම අයැදුම්පත් (2018) යවනු ලැබිණි. සාකච්ඡා මණ්ඩල හරහා, ජාතික පර්යේෂණ සභාව විසින් තවදුරටත් අයැදුම්පත් පරීක්ෂාවට ලක්කොට ඉහළ මට්ටමේ විද්‍යාත්මක කුසලතාවයක් සහ ජාතික අදාලත්වයක් පෙන්නුම් කෙරෙන අයැදුම්පත්, ප්‍රදානය සඳහා තෝරාගනු ලැබිණි.

ක්‍රියාකාරකම	2016	2017	2018
ඇගයීමෙන් පසු මූල්‍යනය සඳහා නෝරාගත් අයැදුම්පත් සංඛ්‍යාව	36	33	24
මූල්‍යනය කරනු ලැබූ ප්‍රදාන සංඛ්‍යාව	34	32	24
භාණ්ඩාගාර ප්‍රතිපාදන හරහා පිරිනමනු ලැබූ ප්‍රදානයන්හී මුළු වටිනාකම	රු. මිලි. 107.6	රු. මිලි. 128.7	රු. මිලි. 98.29

ඉදිරිපත් කරනු ලැබූ අයැදුම්පත් අතරින් 22%ක් (24/109) පමණක් නෝරාගනු ලැබූ අතර නෝරාගනු ලැබූ අයැදුම්පත් මූල්‍යනය සඳහා මහාභාණ්ඩාගාරය වෙත යොමු කරන ලදී.

මෙම වර්ෂය තුළදී, 2018 වර්ෂයේදී ඉදිරිපත් කරනු ලැබූ අයැදුම්පත් ඇසුරෙන් පර්යේෂණ ප්‍රදාන 24ක් මූල්‍යයනය කරනු ලැබූ අතර එම ප්‍රදානයන්හී කටයුතු ආරම්භ කෙරිණි.

වර්ෂය අවසානයේදී, ප්‍රදානයන් 22ක් සඳහා අවසාන ඇගැයීම් සම්පූර්ණ කරනු ලැබ තිබිණි.

2018 දී මූල්‍යයනය කළ පර්යේෂණ ප්‍රදාන

pp. No.	ප්‍රධාන අන්වේශක හා ආයතනය	මාතෘකාව
18-005	මහාචාර්ය ජයසුන්දර බණ්ඩාර, ජාතික මූලික අධ්‍යයන ආයතනය, හන්තාන පාර, මහනුවර.	Copper zinc tin sulfide (CZTS) Photovoltaic – Thermoelectric hybrid system for the fabrication of efficient solar energy conversion devices
18-007	මහාචාර්ය කේ. පී. විදානපතිරණ, ඉලෙක්ට්‍රොනික අධ්‍යයනාංශය, ව්‍යවහාරික විද්‍යා පීඨය, ශ්‍රී ලංකා වයඹ විශ්ව විද්‍යාලය, කුලියාපිටිය.	Fabrication and analysis of super capacitors with low cost composite hybrid electrodes to meet the future energy challenge
18-008	මහාචාර්ය බී. ඒ. එච්. ආර්. ප්‍රේමරත්න, වෛද්‍ය විද්‍යා අධ්‍යයනාංශය, වෛද්‍ය පීඨය - කැලණිය විශ්ව විද්‍යාලය, තැ.පෙ. 6, තලගොල්ල පාර, රාගම.	Islandwide study on Scrub Typhus genotypes, their clinical features, Biochemical markers of severity and transmitting vector species
18-009	මහාචාර්ය ආර්. ඒ. එස්. පී. සේනානායක, උද්භීද විද්‍යා අධ්‍යයනාංශය, විද්‍යා පීඨය, කැලණිය විශ්ව විද්‍යාලය, කැලණිය.	Genetic diversity and cultivar development of Dendrobiums integrating classical and molecular biological tools
18-012	ආචාර්ය ජී. ජී. ජයසිංහ ජාතික කුරුඳු පර්යේෂණ හා පුහුණු මධ්‍යස්ථානය, අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, පලොල්පිටිය, තිහගොඩ, මාතර.	Investigation of aetiology, disease development and management of rough bark disease of cinnamon (*Cinnamomum zeylanicum* Blume)
18-013	මහාචාර්ය කේ. එම්. එන්. ස සිල්වා රසායන විද්‍යා අධ්‍යයනාංශය, කොළඹ විශ්ව විද්‍යාලය, කොළඹ 03.	Transdermal drug delivery via smart textiles: Development of new formulations for the controlled release of natural compounds to prevent cancer

18-028	ආචාර්ය එම්. එන්. ධර්මවීර, ඉංජිනේරු පීඨය, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය, 41, ලුම්බිණී ඇවනිව්, රත්මලාන.	Design, analysis, and optimization of next generation fiber optic national backbone networks
18-030	වෛද්‍ය ඩී. එස්. ජී. මෙත්තානන්ද, ළමා රෝග අධ්‍යයනාංශය, වෛද්‍ය පීඨය - කැලණිය විශ්ව විද්‍යාලය, තැ.පෙ. 6, තලගොල්ල පාර, රාගම.	Foetal haemoglobin induction as a treatment for β-thalassaemia
18-032	ආචාර්ය එස්. එම්. සී. යූ. පී. සුභසිංහ, වන හා පාරිසරික මධ්‍යස්ථානය, වන හා පාරිසරික විද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය, ගංගොඩවිල, නුගේගොඩ.	Production of Mosquito Repellents using Lesser-Known, Under-Utilized Volatile Oil Producing Plant Species
18-035	වෛද්‍ය එස්. පී. සුමනසේන, ආබාධිත විද්‍යා අධ්‍යයනාංශය, වෛද්‍ය පීඨය - කැලණිය විශ්ව විද්‍යාලය, තැ.පෙ. 6, තලගොල්ල පාර, රාගම.	Effectiveness of an intervention to introduce reading skills to school children with features of dyslexia in the Gampaha District in Sri Lanka; a randomized clinical trial
18-043	ආචාර්ය එස්. කේ. අබේගුණවර්ධන විද්‍යුත් ඉංජිනේරු අධ්‍යයනාංශය මොරටුව විශ්ව විද්‍යාලය, කටුබැද්ද, මොරටුව.	Impact of Increasing Renewable Energy Developments on the Reliability of Power Generating Systems
18-044	ආචාර්ය ආර්. ඒ. ආර්. සී. ගොරුපා යාන්ත්‍රික ඉංජිනේරු අධ්‍යයනාංශය, මොරටුව විශ්ව විද්‍යාලය, මොරටුව.	Development of a Soft Robot Gripper with Inbuilt Sensors for Deformable Object Grasping and Tactile Feedback
18-050	ආචාර්ය ආර්. පී. හේවාවසම් ජෛවරසායන විද්‍යා අධ්‍යයනාංශය, වෛද්‍ය පීඨය, රුහුණු විශ්ව විද්‍යාලය, කරාපිටිය, ගාල්ල.	Cardioprotective effect of three medicinal plants against doxorubicin induced cardiotoxicity in Wistar rats and in neonatal ventricular cardiomyocytes
18-057	මහාචාර්ය ඩබ්ලිව්. අබේවික්‍රම, අතුරු සායනික විද්‍යා අධ්‍යයනාංශය, කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය, කඳවල පාර, රත්මලාන.	Novel and Innovative Strategies to Control *Anopheles stepheles stephensi* and other malaria vectors for prevention of reintroduction of malaria in Sri Lanka
18-063	ආචාර්ය ඩී. ටී. අබේසිංහ රසායන විද්‍යා අධ්‍යයනාංශය, ස්වභාවික විද්‍යා පීඨය, ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය, තැ.පෙ. 21, නාවල, නුගේගොඩ.	Absorption of selected pesticide residues during cooking by curry leaves available in Sri Lanka and its impact on the carotenoid compositional variation in curry leaves
18-066	ආචාර්ය එම්. ඒ. ඉලංගසිංහ රසායන හා ක්‍රියාවලි ඉංජිනේරු අධ්‍යයනාංශය, ඉංජිනේරු පීඨය, පේරාදෙණිය විශ්ව විද්‍යාලය, පේරාදෙණිය.	Understanding exposure levels of volatile organic compounds and fine particulate matter while commuting in Kandy city
18-077	මහාචාර්ය සුන්දරලංගම් තිරුක්කුනේෂ්, ගණිත අධ්‍යයනාංශය, විද්‍යා පීඨය, ශ්‍රී ලංකා නැගෙනහිර විශ්ව විද්‍යාලය, වන්තරුම්මූලෙයි, චෙන්කලාඩි.	Modeling and description of compact astrophysical objects using Einstein's field equations
18-079	වෛද්‍ය ඒ. ඩී. ද සිල්වා, වෛද්‍ය පීඨය, කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය,	Isolation and identification of environmental *Burkholderia pseudomallei* and comparative

	රත්මලාන.	analysis of major virulent associated genes from clinical isolates of infected Sri Lankan Melioidosis patients
18-080	වෛද්‍ය එස්. හෙට්ටිආරච්චි, ආබාධිත විද්‍යා අධ්‍යයනාංශය, වෛද්‍ය පීඨය - කැලණිය විශ්ව විද්‍යාලය, තැ.පෙ. 6, තලගොල්ල පාර, රාගම.	Developing and validating a speech sound (articulation and phonology) assessment for Sri Lankan Tamil-speaking children aged 3 to 6 years
18-083	ආචාර්ය අයි. වී. එන්. රත්නායක, ක්ෂුද්‍ර ජීවවිද්‍යා අධ්‍යයනාංශය, විද්‍යා පීඨය, කැලණිය විශ්ව විද්‍යාලය, කැලණිය.	Development of a phototrophic-heterotrophic biofilm/mat for the detoxification and removal of Chromium in waste water.
18-084	ආචාර්ය එම්. ජී. එම්. කේ. මීගහකුඹුර, පොල් පර්යේෂණ ආයතනය, බන්දිරුප්පුව වත්ත, ලුණුවිල.	Identification of drought tolerant coconut mother palms through phenotypic, physiological and gene expression studies
18-088	ආචාර්ය එන්. එම්. සී. නයනකාන්ත, රබර් පර්යේෂණ ආයතනය,, ඩ්‍රොන්ටන්ෆිල්ඩ්, අගලවත්ත.	Effect of priming of rubber (*Hevea brasiliensis*) plants with some natural or chemical compounds on growth and abiotic stress alleviation under sub-optimal climatic conditions in Ampara District of Sri Lanka
18-091	ආචාර්ය එච්. ඒ. සී. කේ. ආරියරත්න උද්භීද විද්‍යා අධ්‍යයනාංශය, විද්‍යා පීඨය, පේරාදෙණිය විශ්ව විද්‍යාලය, පේරාදෙණිය.	In-silico mining for resistance gene analogs and identification of genetic resources for blast disease resistance in the local finger millet germplasm
18-094	ආචාර්ය ඩී. සී. මුදන්නායක, සත්ව විද්‍යා අධ්‍යයනාංශය, සත්ව විද්‍යා හා අපනයන කෘෂිකර්ම පීඨය, ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලය බදුල්ල.	Extraction, purification and chemical characterization of inulin-type fructans from three Asparagus species (*A. falcatus, A. racemosus, and A. officinalis*) grown in Sri Lanka, and their utilization as potential prebiotic ingredients in dairy products.

<u>පරිසර හිතකාමී වල් පැළෑටි පාලනය කිරීමේ ක්‍රම සඳහා විශේෂ මූල්‍යාධාර ප්‍රදානයන්</u>

“පරිසර හිතකාමී වල් පැළෑටි පාලනය කිරීමේ ක්‍රම” පිළිබඳ විද්‍යාත්මක පර්යේෂණ ව්‍යාපෘති වලට අරමුදල් ලබාදීම සඳහා 2018දී විශේෂ වැඩසටහනක් ආරම්භ කරන ලදී.

සියළු විශ්ව විද්‍යාල, පීඨයන් හා සියළු රජයේ සංවර්ධන හා පර්යේෂණ ආයතන අතර සංසරණය කරන ලද පුවත්පත් දැන්වීමක් මගින් පර්යේෂකයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබිය.

අයදුම්පත් කැඳවීමේ අවසන් දිනය 2018 මැයි 11 වූ අතර අයදුම්පත් 06ක් ලැබිණි. එම අයදුම්පත් ඇගයීම සඳහා විෂය ක්ෂේත්‍රයේ විශේෂඥයින් වෙත යවනු ලැබිය. මණ්ඩල සාකච්ඡා හරහා සභාව විසින් අයදුම්පත් තවදුරටත් පරීක්ෂාකර ඉහල විද්‍යාත්මක යෝග්‍යතාවයක් හා ජාතික වශයෙන් වැදගත්කමක් ඇති අයදුම්පත් තෝරාගනු ලැබිය.

ලැබුණු අයදුම් පත් සංඛ්‍යාව	06
විස්තරාත්මක යෝජනා සඳහා තෝරාගනු ලැබූ අයදුම් පත් සංඛ්‍යාව	05
පිරිනමන ලද ප්‍රදාන සංඛ්‍යාව	04
ලබාදෙන ලද මුළු මූල්‍යාධාර (රු)	22,064,874.00

"පරිසර හිතකාමී වල් පැළෑටි පාලනය" යටතේ ලබා දෙන ලද මූල්‍යාධාර

අයදුම්පත් අංකය	**ප්‍රධාන අන්වේශක**	**මාතෘකාව**	**මූල්‍යාධාර අගය (රු)**
EWC 18-02	මහාචාර්ය බුද්ධි මාරඹේ පේරාදෙණිය විශ්ව විද්‍යාලය	Use of *Artemisia vulgaris* (L) as an eco-friendly and economically-viable component in integrated management of weeds, insect and mite pests and nuisance pests in tea fields of Sri Lanka	4,954,000.00
EWC 18-03	මහාචාර්ය යූ.එල්.බී.ජයසිංහ ජාතික මූලික අධ්‍යයන ආයතනය	Microbial metabolites - a source for development of eco-friendly new weedicides	4,643,724.00
EWC 18-04	ආචාර්ය එච්.එම්. ස්වර්ණා හේරත් වී පර්යේෂණ හා සංවර්ධන ආයතනය	Development of eco-friendly integrated weed management system for rice farming	6,520,000.00
EWC 18-05	ආචාර්ය කේ.ජී.ප්‍රේමතිලක ශ්‍රී ලංකා උඩව වෙල්ලස්ස විශ්ව විද්‍යාලය	Investigations on eco-friendly cultural, physical and allelopathic weed management strategies for tea cultivation as alternatives for synthetic herbicides	5,947,150.00

විද්‍යාමක ප්‍රකාශන සඳහා ජනාධිපති සම්මාන ප්‍රදානය

විද්‍යාත්මක ප්‍රකාශන සඳහා ජනාධිපති සම්මාන ප්‍රදානෝත්සවය, එකලොස්වන වරට ද 2018 නොවැම්බර් 19 දින කොළඹ, ටාජ් සමුද්‍ර හෝටලයේදී පවත්වන ලදී.

ප්‍රසාරිත විද්‍යා සඳහන් දර්ශනයේ ශ්‍රේණිගත සඟරාවල, ප්‍රකාශන පළකල විද්‍යාඥයින් 338දෙනෙකු සඳහා (2016 වසරට අදාළව) සම්මාන පිරිනමන ලදී. 2016 වසර තුලදී වෛද්‍ය විද්‍යාව, කෘෂිකර්මය සහ ඉංජිනේරු විද්‍යාව ඇතුළත් විෂයයන් පිළිබඳ පළවූ ප්‍රකාශන 600කට අධික සංඛ්‍යාවක් සඳහා සම්මාන පිරිනැමිණි.

මෙම අවස්ථාව සඳහා ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා සහභාගී වූ අතර අධ්‍යාපන හා උසස් අධ්‍යාපන රාජ්‍ය අමාත්‍ය මොහාන් ලාල් ග්‍රේරු මැතිතුමා සහ අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් පද්මසිරි ජයමාන්න මැතිතුමන් ද ආරාධිත අමුත්තන් ලෙස සහභාගී වූහ. තවද, පර්යේෂණ හා සංවර්ධන ආයතනයන්හී, විශ්වවිද්‍යාලයන්හී සම්භාවනීය ආරාධිතයින්ද, සම්මාන ලැබූවන්ද මෙම අවස්ථාව සඳහා සහභාගී වූහ.

ජාතික පර්යේෂණ සභාව විසින් ජනාධිපති ලේකම් කාර්යාලයේ සහ රේඛීය අමාත්‍යාංශයේ සහයෝගීතාවයෙන් මෙම උළෙල සංවිධානය කරන ලදී.












lication












විද්‍යාත්මක ප්‍රකාශන සඳහා ජනාධිපති සම්මාන
விஞ்ஞான ஆய்வுக்கள ஜனாதிபதி விருதுகள்
President's Awards for Scientific Publication

රාජ්‍ය පෞද්ගලික සහයෝගිතා වැඩසටහන

මෙම කාලසීමාව තුලදී රාජ්‍ය පෞද්ගලික සහයෝගීතා (PPP) වැඩසටහන අඛණ්ඩව ක්‍රියාත්මක කෙරිණි.

ක්‍රියාකාරකම්	2016	2017	2018
රාජ්‍ය-පෞද්ගලික සහයෝගීතාවය සඳහා ලද අභිමතයන් පළකිරීම් (EOI) සංඛ්‍යාව	12	10	15
විස්තරාත්මක යෝජනාවන් ඉදිරිපත් කිරීම සඳහා තෝරාගත් EOI සංඛ්‍යාව	9	4	7
පෞද්ගලික අංශය සමඟ ඇතිකරගත් සහයෝගීතාවයන් සංඛ්‍යාව	3	2	3
අවශ්‍ය මුළු මුදල	රු. මිලි. 56.69	රු. මිලි. 6.84	රු. මිලි. 20.26
පෞද්ගලික අංශය මඟින් සපයනු ලැබූ මුදල (දළ වශයෙන් 50%)	රු. මිලි. 28.34	රු. මිලි. 3.42	රු. මිලි. 10.13

දැනට ක්‍රියාත්මක රාජ්‍ය පෞද්ගලික සහයෝගීතාවන් .....

පර්යේෂණ සහකරු	**ව්‍යාපෘති නාමය**
ආචාර්ය ශාන්ත වල්පලගේ මොරටුව විශ්ව විද්‍යාලය	Development of a material using natural rubber and polyethylene as a substitute to conventional roofing sheets
ජී. එල්. සි. ගලහිටියාව මහතා / එම්. ඒ. වමින්ද්‍ර මහතා තේ පර්යේෂණ ආයතනය	Development of Self-Cleaning Sifter with multiple mesh frames for grading long leafy & wiry type tea
ආචාර්ය අනිල් ගුණතිලක ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය	Locally Developed Sustained Release Tablets
ආර්.එම්. ධර්මදාස මහතා කාර්මික තාක්ෂණ ආයතනය	Extraction and formulation of plant protection products from endemic plants for healthy growth of crops free from sucking insects (mealybugs, aphids, whiteflies and thrips) causing yellowing, wilting and leaf-curl
ආචාර්ය එන්.එම්.එස්. සිරිමුතු ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය	Nanomaterials for improved electrical conductivity of natural rubber compound for non-marking solid tires

පර්යේෂණ සහකරු	ව්‍යාපෘති නාමය
මහාචාර්ය එන්.කේ.බී. අදිකාරම් ජාතික මූලික අධ්‍යයන ආයතනය	Study of a postharvest disease and disorders adversely affecting the export potential of mango var. TomEJC and their management
ආචාර්ය මාලක ජේ. වල්පොල / ආචාර්ය කුටිල ගුණසේකර මොරටුව විශ්ව විද්‍යාලය	Cross platform for annotations in mobile tablets
ආචාර්ය ජේ. සි. පී. එච්. ගමගේ මොරටුව විශ්ව විද්‍යාලය	Development of an economical insulation system for externally strengthened FRP / Concrete composites using locally available materials
මහාචාර්ය එස්. ආර්. මුණසිංහ මොරටුව විශ්ව විද්‍යාලය	Development of commercial prototypes of multipurpose drones – CeyGull and CeyBell
ආචාර්ය ගෝබිතාස් තාමරාජා ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය	A composition and method of seepage control using fibrous material

වෙනත් වැඩසටහන්

පොලිතීන් තිරසර කළමනාකරණය පිළිබඳ සුභසාධක වැඩසටහන

ජාතික පර්යේෂණ සභාව විසින්, ජනාධිපති ලේකම් කාර්යාලය, විද්‍යා, තාක්ෂණ සහ පර්යේෂණ අමාත්‍යාංශය, තිරසර සංවර්ධන සහ වනජීවී අමාත්‍යාංශය සහ මධ්‍යම පරිසර අධිකාරිය හා එක්ව 2017 සිට පොලිතීන් තිරසර කළමනාකරණය සඳහා වැඩසටහනක් දියත් කරනු ලැබීය. එම වැඩසටහන ජාතික පර්යේෂණ සභාව විසින් ආරම්භ කරන ලද ඒකාබද්ධ සමාජ සුභසාධක වගකීම් (CSR) වල ආරම්භයන් වනු ඇති බවටද අපේක්ෂිතය.

මෙම වැඩසටහන උතුරු මැද පළාතේ (NCP) පාසල් ළමුන් අතර පොලිතීන් භාවිතය අවම කිරීමේ අදහස ඇති කිරීම සඳහා වන දැනුවත් කිරීමේ වැඩසටහනක් විය. එමගින් මූලික වශයෙන් උතුරු මැද පළාතේ (NCP) පාසල් ළමුන් ඉලක්ක කෙරිණ. සාපේක්ෂ වශයෙන් කුඩා ජන ගණත්වයක් සහිත ප්‍රදේශයක් වුවද සෑම වසරකම උතුරු මැද පළාතේ ඝන අපද්‍රව්‍ය ප්‍රමාණය ඉහල යන බැවින් ජාතික පර්යේෂණ සභාව විසින් එය රටේ පොලිතීන් ගැටළුව සඳහා විසඳුම් සෙවීමේ වැඩසටහන් පැවැත්වීම සඳහා මොඩලයක් ලෙස යොදා ගැනීම සම්බන්ධයෙන් උතුරු මැද පළාත් සභාවේ නිලධාරීන් සමඟ මූලික සාකච්ඡා සිදුකර ඇත. මෙම සාකච්ඡාවේදී නිලධාරීන්ගෙන් 95% පමණ (ඒ සඳහා සහභාගිවූ නිලධාරීන් 120න්) පාසල් ළමුන් අතර පරිසර හිතකාමී ආකල්ප ඇති කිරීමේ/ වැඩි දියුණු කිරීමේ අධ්‍යාපනික වැඩසටහනක් ඉල්ලා සිටින ලදී.

එම නිසා ජාතික පර්යේෂණ සභාව විසින් පාරිසරික, සෞඛ්‍යය, ඝන අපද්‍රව්‍ය කළමනාකරණය හා රසායනික ක්‍රියාවලි ඉංජිනේරු විද්‍යාව වැනි ආදාල ක්ෂේත්‍රයන්හි යම් විශේෂඥයින් සමඟ අධ්‍යාපනික වැඩසටහනක් ගොඩනලනු ලැබීය.

මෙම වැඩසටහනට පියවර තුනක් ඇතුලත්වේ.

1. මූලික සාකච්ඡා - 2017
2. පුහුණුකරුවන් පුහුණු කිරීම - 2017
3. ගුරුවරුන් පුහුණු කිරීමේ වැඩසටහන - 2018
4. ප්‍රගතිය සඳහා දත්ත රැස්කිරීම
5. අධීක්ෂණය හා ඇගයීම

ගුරුවරුන් පුහුණුකිරීමේ වැඩසටහන

එක් පුහුණුකරුවකුට පාසල් දෙකකට වැඩි සංඛ්‍යාවක් සම්බන්ධයෙන් කටයුතු කල නොහැකි බව ජාතික පර්යේෂණ සභාව තේරුම් ගත් බැවින් ඉහත එක් එක් අධ්‍යාපන කලාපයෙන් එක් ගුරුවරයෙකු බැගින් තෝරා ගෙන පුහුණු වැඩසටහන් ආරම්භ කර ඇත.

පුහුණු වැඩසටහන සඳහා ගුරුවරුන්ගේ සහභාගිත්වය

දිනය	ස්ථානය	පාසල් සංඛ්‍යාව	සහභාගිවූවන් සංඛ්‍යාව	නොපැමිණි සංඛ්‍යාව
2017 ඔක්. 13	දිඹුලාගල	111	49	62
2018 මාර්තු 27	කැඹිතිගොල්ලෑව	134	85	49
2018 අප්‍රේල් 03	පොළොන්නරුව	54	25	29
2018 මැයි 10	තඹුත්තේගම	76	57	19
2018 මැයි 11	අනුරාධපුරය	140	88	52
2018 මැයි 16	හිගුරක්ගොඩ	94	64	30
2018 මැයි 17	ගලෙන්බිඳුනුවැව	73	75	2
2018 මැයි 18	කැකිරාව	133	72	61
එකතුව		**814**	**515**	**304**



ගුරුවරුන් පුහුණු කිරීමේ වැඩසටහන

කැඹිනිගොල්ලෑව ගුරුවරුන් පුහුණු කිරීමේ වැඩසටහන	**ස්ථානය:** කැඹිනිගොල්ලෑව කලාප අධ්‍යාපන කාර්යාලයේ ශ්‍රවණාගාරය
	සම්පත් දායකත්වය: මහාචාර්ය සරත් කොටගම
	ඉලක්කගත පිරිස: කැඹිනිගොල්ලෑව අධ්‍යාපන කලාපයේ ගුරුවරුන් 85 දෙනෙක්




තඹුත්තේගම ගුරුවරුන් පුහුණු කිරීමේ වැඩසටහන	**ස්ථානය :** තඹුත්තේගම කලාප අධ්‍යාපන කාර්යාලයේ ශ්‍රවණාගාරය
	සම්පත් දායකත්වය: මහාචාර්ය සරත් කොටගම
	ඉලක්කගත පිරිස: තඹුත්තේගම අධ්‍යාපන කලාපයේ ගුරුවරුන් 76 දෙනෙක්





පොලොන්නරුව ගුරුවරුන් පුහුණු කිරීමේ වැඩසටහන	**ස්ථානය :** පොලොන්නරුව රාජකීය විද්‍යාලයීය ශ්‍රවණාගාරය
	සම්පත් දායකත්වය: සම්පත් නෝනිස් මහතා, නදීකා දිසානායක මිය
	ඉලක්කගත පිරිස: පොලොන්නරුව අධ්‍යාපන කලාපයේ ගුරුවරුන් 25 දෙනෙක්





අනුරාධපුරයේ ගුරුවරුන් පුහුණු කිරීමේ වැඩසටහන	**ස්ථානය :** අනුරාධපුර වලිසිංහ හරිස්චන්ද්‍ර විද්‍යාලයීය ශ්‍රවණාගාරය
	සම්පත් දායකත්වය: මහාචාර්ය සරත් කොටගම
	ඉලක්කගත පිරිස: අනුරාධපුර අධ්‍යාපන කලාපයේ ගුරුවරුන් 88 දෙනෙක්





